**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදලෙ (ටීබී) සංරචකය 6 වන වටය ව්‍යාපෘතිය - 2012**

---

## 1. <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඈ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මූල්‍ය කාර්යසාධන</u>

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.112,514,556 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.654,545,769 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම , ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| අයිතමය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| වෛද්‍ය උපකරණ හා අනෙකුත් වත්කම් | 18,536,038 | 45,010,345 | 122,090,080 |
| ක්ෂය රෝග මර්දන කටයුතු | 93,978,518 | 174,969,016 | 532,455,689 |
| | 112,514,556 | 219,979,361 | 654,545,769 |

## 2.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2011 සහ 2012 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශ පහත සඳහන් පරිදිවේ.

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතු වල මුදල් ප්‍රවාහය** | | |
| විදේශ ආධාර ප්‍රදාන වලින් ලැබුණු මුදල් (වැය -13) | 142,800,000 | 172,500,000 |
| ටෙන්ඩර් ආදායම් | 14,000 | - |
| වැඩ සටහන් වියදම සඳහා ගෙවන ලද මුදල් | (93,978,518) | (174,969,015) |
| දෙන ලද අත්තිකාරම් (ශුද්ධ) | (5,396,869) | 48,940,488 |
| ගෙවීම් වැඩිවීම් (රඳවා ගැනීමේ බද්ද සහ රඳවා ගැනීම්) | (196,549) | (1,028,103) |
| මෙහෙයුම් කටයුතු වල ශුද්ධ මුදල් ප්‍රවාහය | 43,242,064 | 45,443,370 |
| **ආයෝජන කටයුතු වල මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් | (18,536,038) | (45,010,345) |
| ආයෝජන කටයුතු වල ශුද්ධ මුදල් ප්‍රවාහය | (18,536,038) | (45,010,345) |
| **මූල්‍ය කටයුතු වල මුදල් ප්‍රවාහය** | | |
| අමාත්‍යාංශයට (භාණ්ඩාගාරයට ) මුදල් ආපසු යැවීම | (24,706,026) | (433,025) |

(අ) 2011 වර්ෂයට අදාළ අනුරූප සංඛ්‍යා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොමැත.

(ආ) සමාලොචිත වර්ෂයේදි ලද රු.142,800,000 ක මුදලින් රු.24,706,026 ක් හෙවත් සියයට 17 ක් භාණ්ඩාගාරයට ආපසු යවා ඇත.

## 3. විගණන නිරීක්ෂණ

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපෘතිය සඳහා ලැබූ මුළු ප්‍රදාන විදේශාධාර හා රජයේ දායකය ලෙස වෙන් වශයෙන් පෙන්වා නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ එකතුව රු. 7,194,554 ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් අයතම් 03 ක් ගිණුම් ගත කර නොතිබුණි.

## 3.2 <u>නීති, රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2006- ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහය | |
| (i) 4.2.3 වගන්තිය | එකතුව රු.11,985,009 ක් වටිනා වෛද්‍ය උපකරණ අයිතම් 33 ක් ප්‍රසම්පාදන සඳහා සති 12 ක් වෙනුවට සති 48 ක් ගත වී තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාස | |
| (i) අංක 371 (2)(ඇ) | අත්තිකාරම් මුදල් දෙන ලද කාර්ය නිම කල වහාම පියවිය යුතු වුවත් රු.1,338,550 ක් වූ අත්තිකාරම් 15 ක් නිරවුල් කිරීම සඳහා මාස 2 1/2 සිට මාස 9 1/2ක කාලයක් ප්‍රමාද වූ අවස්ථා තිබුණි. |
| (ii) අංක 756 | රු. 122,090,080 වටිනාකම වූ ස්ථාවර වත්කම්වලට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා භෞතික සත්‍යාපනය සිදුකර නොතිබුණි. |
| (ඇ) 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්/ඊආර්ඩී/2007/02 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන ඊළඟ වර්ෂයේ මාර්තු 31 හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළයුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2013 ජුනි 25 දිනදීය. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | වටිනාකම<br>රු. | විස්තරය |
|---|---|---|
| (අ) පුහුණු වැඩසටහන් | 8,390,811 | (i) 2012 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා වෙන්කළ මුදල රු.13,259,134 ක් වූ අතර පුහුණු වැඩසටහන් සඳහා වැයකර තිබුණේ රු.4,868,322 කි. ඒ අනුව රු.8,390,811 පුහුණු වැඩ සටහන් සඳහන් යොදා නොගෙන ඉතිරිව තිබුණු අතර එය සියයට 63 ක් දක්වා වූ ප්‍රමාණයක් විය.<br>(ii) බහු ඖෂධ ප්‍රතිවිරෝධී පුහුණු වැඩ සටහන සඳහා ලබා දෙන ලද මුළු ප්‍රතිපාදනයම උපයෝගි කර නොමැති අතර වැඩ සටහන් 5ක් සඳහා වෙන්කරන ලද අරමුදල් වලින් ඌන උපයෝජනය , සියයට 79 සිට සියයට 99 දක්වා වන පරාසයක පැවතුණි.<br>(iii) 2012 වර්ෂයේ නිලධාරීන්ට ලබාදීමට අපේක්ෂා කළ පුහුණු වැඩමුළු සංඛ්‍යාව 130 ක් වූ අතර සත්‍ය වශයෙන් පවත්වා තිබුණේ වැඩසටහන් 78 ක් පමණි.<br>(iv) 2012 වර්ෂයේ පුහුණු වැඩමුළු සඳහා සහභාගි කර ගැනීමට බලාපොරොත්තු වූ නිලධාරීන් සංඛ්‍යාව 3,114 ක් වූ අතර සත්‍ය වශයෙන් සහභාගි වූ සංඛ්‍යාව 1,803 ක් විය. |

(ආ) පිරිවිතරයන්ට අනුකූල නොවී තිබියදීත් ඒ ගැන සැලකිලිමත් නොවී වෛද්‍ය උපකරණ සැපයීම සඳහා ඉහළම මිලගණන් ඉදිරිපත් කරන ලද සැපයුම්කරු තෝරා ගෙන තිබුණි.

| අයිතමය | එකග වූ මුදල<br>රු. | නියමිත පිරිවිතර | සත්‍ය වශයෙන් සපයන ලද අයිතම |
|---|---|---|---|
| (i) II වන පන්තියේ ජීව ආරක්ෂක කැබිනෙට්ටු දෙකක් මිලදී ගැනිම. (Bio Safety cabinets) | 4,407,849 | පිටත කුටිර පරිමානය මි.මි 1300x1400x750 (ප.උ.පර) ට නොඅඩු විය යුතු අතර ඇතුළත කුටිර පරිමානය මි.මි 1175x650x575ට නොඅඩු වියයුතුය. | මි.මි 1390x1380x748 ( ප.උ.පර)<br>මි.මි1200x635x425( ප.උ.පර) |

| | | | |
|---|---|---|---|
| (ii) කේන්ද්‍රාපසාරක 02 ක් මිලදී ගැනිම ( Centrifuge) | 1,792,000 | උපරිම වේගය 5000-6000rpm/max<br>Max RCF 4600-6240Max | 15,200rpm<br>25,830xg |

3.4 <u>ආර්ථික නොවන ගනුදෙනු</u>

පැවැත්වීමට නියමිතව තිබුණු ප්‍රගති සමාලෝචන රැස්වීම නොපැවැත්වීම හේතුවෙන් හෝටලයකට ගෙවන ලද රු. 100,000 ක් වූ ගෙවන ලද අත්තිකාරම් මුදල ආපසු අයකර ගැනිමට නොහැකිවිය.

4. <u>අරමුදල් උපයෝජනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වෙන්කර තිබුණු එකතුව රු.8,937,668 ක් වු අයවැයගත වෙන්කිරීම් අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති ක්‍රියාකාරකම් 14 ක කටයුතු සඳහා රු.11,832,252 ක අයවැයගත මුදලක් වෙන්කරනු ලැබ තිබුණද 2012 දෙසැම්බර් 31 දින වන විට මුළු ප්‍රතිපාදනයෙන් සියයට 20 කට සමාන ප්‍රමාණයක් එනම් රු.2,377,319 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) අදාළ බලධාරින්ගේ නිසි අනුමැතියක් ලබාගැනිමෙන් තොරව කාර්යන් 8 ක් සඳහා අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා රු.27,526,612 ක මුදලක් වැයකර තිබුණි.

(ඈ) ක්ෂය රෝග සංරවකය 6 වන වටය ව්‍යාපෘතියේ ආරම්භක දනය වන 2008 ජනවාරි 01 දිනයේදි ඒ සඳහා ගිවිසුම්ගත මුදල ඇ.ඩො.8,246,378 ක් වු අතර එම මුළු මුදලම ලබාදීමට ව්‍යාපෘතිය එකග වී තිබුණි. එම නිසා ව්‍යාපෘතියේ අවසන් දින වන විට කිසිදු ව්‍යාපෘති ක්‍රියාකාරකමක් සඳහා උපයොගිකොට නොගත් ඇ.ඩො.1,191,432 ක මුදලක් ශේෂව පැවැතුණි.

5. <u>අභ්‍යන්තර විගණනය</u>

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ව්‍යාපෘතයේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබණි.

6. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) භාණ්ඩ ප්‍රසම්පාදනය
(ආ) තොග
(ඇ) අරමුදල් උපයෝජනය
(ඈ) අග්‍රිම හා අත්තිකාරම් නිරවුල් කිරිම
(ඉ) ගිණුම්කරණය